0596

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

RICHMOND COLLEGE LIBRARY * GALLE *

නම/විභාග අංකය :-- ............................................................................. කාලය : පැය 02 යි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.
  ලකුණු 2 X 20 = 40

### I කොටස

1. මෙයින් අවුරුදු දහසක් ඉකුත් වූ කල බුදු කෙනෙකුන් උපදිනවා යයි දෙවියන් හඬ නඟා කියමින් ඇවිදිනවා. මෙම ප්‍රකාශය,
   1. ධර්ම කෝලාහලයයි
   2. බුද්ධ කෝලාහලයයි
   3. සංඝ කෝලාහලයයි
   4. දේව කෝලාහලයයි

2. සිදුහත් බෝසතාණන්ට මනුලොව උපදින්නට ආරාධනා කළේ,
   1. අසිත තවුසාණන්ය
   2. සතර වරම් දෙවිවරුය
   3. සහම්පති මහා බ්‍රහ්මයා ප්‍රමුඛ දෙවියන්, බඹුන්
   4. සුද්ධෝදන රජතුමාය

3. ශරීර ලක්ෂණ අනුව කුමරු ඒකාන්තයෙන්ම බුදු වන බව පැවසුවේ,
   1. වප්ප බමුණාය
   2. කොණ්ඩඤ්ඤ බමුණාය
   3. භද්දිය බමුණාය
   4. අස්සජි බමුණාය

4. සිදුහත් කුමරු සමඟ එකට හැදුණු කුමාරවරුන් වන්නේ,
   1. නන්ද හා කාළුදායි කුමාරවරුන්ය
   2. දෙව්දත් හා ඡන්න කුමාරවරුන්ය
   3. භද්දවග්ගිය කුමාරවරුන්ය
   4. නන්ද හා පිප්පලී කුමාරවරුන්ය

5. සුද්ධෝදන රජතුමා තම කුමරුට දෙවන වැඳුම සිදුකළේ,
   1. අසිත තවුසාණන් ඉදිරියේ ය
   2. වප්මගුල් දිනයේ ය
   3. සර්වමිත්‍ර බමුණා ඉදිරියේ ය
   4. කොණ්ඩඤ්ඤ බමුණා ඉදිරියේ ය

6. සිදුහත් කුමරුගේ සන්සුන් බව දැක නිබ්බුත පද ප්‍රකාශ කළේ,
   1. ප්‍රජාපතී ගෝතමී කුමරිය ය
   2. යශෝදරා කුමරිය ය
   3. කිසා ගෝතමී කුමරිය ය
   4. සුජාතා දේවිය ය

7. පැවිදි වූ සිදුහත් කුමරුට සිවුරු පිරිකර පූජා කළේ,
   1. ඝටීකාර බ්‍රහ්මයා විසින් ය
   2. පස්වග තවුසන් විසින් ය
   3. ඡන්න නම් ඇමතියා විසින් ය
   4. සතර වරම් දෙවිවරු විසින් ය

8. බෝධි වන්දනා ගාථාවේ මුල්පද පේළිය වන්නේ,
   1. සද්ධාය සමප දිත්තේන දීපේන තමධංසිනා
   2. වන්දාමි චේතියං සබ්බං සබ්බඨානේසු පතිට්ඨිතං
   3. යස්සමූලේ නිසින්නෝව සබ්බාරි විජයං අකා
   4. සුගන්ධිකාය වදනං අනන්ත ගුණ ගන්ධිනං

9. 'මේ වැලි දෝතේ වැලි කැට ප්‍රමාණයට මට ගුරුවරුන්ගේ අවවාද ලැබේවායි' ප්‍රාර්ථනා කළේ,
   1. සුනීත පොඩි හාමුදුරුවෝය
   2. ආනන්ද හාමුදුරුවෝය
   3. රාහුල හාමුදුරුවෝය
   4. නන්ද හාමුදුරුවෝය

10. 'කම්මැලි නැති කම' යන අදහස ලබාදෙන පාලි වචනය,
1. වුද්ධානුමතං 2. සුතං 3. ධම්මානුවත්ති 4. අලීනතා

11. සිවුබඹ විහරණයෙන් යුතුව අප කෙරෙහි ලැදිව කටයුතු කරන්නේ,
1. ගුරුවරුන්ය 2. භික්ෂූන් වහන්සේලාය 3. හිතමිතුරන්ය 4. දෙමාපියන්ය

12. ජාතියේ ශක්තිය හා වීර පැවැත්ම මූර්තිමත් කරන ජාතික සංකේතය වන්නේ,
1. බෝ ගස 2. නා ගස 3. පොල් ගස 4. කොස් ගස

13. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය ලෙස නමකර ඇත්තේ,
1. බෝවිටියා මල 2. රෝස මල 3. සුදු මහනෙල් මල 4. නිල් මහනෙල් මල

14. රජගහනුවර මචල ග්‍රාමයෙහි අභියෝගයන්ට මුහුණ දෙමින් කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කරමින් සිය වගකීම් ඉටුකළ තරුණ පිරිසක් පිළිබඳ කියැවෙන්නේ,
1. මඝ මානවක කතාවෙනි
2. සුජාතාවගේ කතාවෙනි
3. රාහුල හිමිගේ කතාවෙනි
4. අස්සජි හිමිගේ කතාවෙනි

15. තමා වැරදි නොකිරීම, අන් අය ලවා වැරදි නොකරවීම, අන් අය කරන වැරදි අනුමත නොකිරීම, දහමෙහි හඳුන්වන්නේ,
1. පංච ශීලය නමිනි
2. විරමනය හා සමාදානය නමිනි
3. ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය නමිනි
4. අෂ්ඨාංග ශීලය නමිනි

16. දෙවන පන්සිල් පදයට අනුව 'ලද දෙයින් සතුටුවන බව' දක්වෙනන කවි පදය කුමක්ද?
1. නුදුන් දෙයක් හොර සිතකින් නොගන්නෙමි
2. අනුන් ලවා හොරකම් නොකරවන්නෙමි
3. හොරෙන් ගැනුම අනුමත නොම කරන්නෙමි
4. ලැබෙන්නෙකින් සතුටුව දිවි ගෙවන්නෙමි

17. අර්ධ පර්යංකයෙන් (පාද පසුපසට නමා) භාවනාව සඳහා හිඳගන්නේ,
1. උපාසකවරුන්ය
2. ස්වාමීන්වහන්සේලාය
3. උපාසිකාවන්ය
4. හිතමිතුරන්ය

18. පන්සලේ දී වන්දනා මාන කළ යුතු අනු පිළිවෙල,
1. වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ, පිළිම වහන්සේ
2. වෙහෙර වහන්සේ, පිළිම වහන්සේ, බෝධීන් වහන්සේ
3. පිළිම වහන්සේ, බෝධීන් වහන්සේ, වෙහෙර වහන්සේ
4. බෝධීන් වහන්සේ, පිළිම වහන්සේ, වෙහෙර වහන්සේ

19. බුදු දහමට අනුව 'දියුණුව' පිළිබඳ පහත ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. මිළ මුදල් වැඩියෙන් ඇති තැනැත්තා දියුණු පුද්ගලයෙකි
2. දැහැමි, නිරෝගී, සිල්වත්, උගත් තැනැත්තා දියුණු පුද්ගලයෙකි
3. ඉහල තනතුරක් දරන්නා දියුණු පුද්ගලයෙකි.
4. ගේ දොර ඉඩකඩම්, යාන වාහන ඇති තැනැත්තා දියුණු පුද්ගලයෙකි

20. දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකමක් ලෙස සිගාලෝවාද සූත්‍රයෙහි දක්වා ඇත්තේ,
1. අහාරපාන සපයාදීම
2. පරම්පරාව රැකගැනීම
3. යහපතෙහි යෙදවීම
4. අවශ්‍යතා ඉටුකරදීම

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

1. i. සිදුහත් කුමරු හදාවඩාගත් මහා මායා දේවියගේ නැගණියගේ නම කුමක්ද?
   ii. දුකින් මිදීමේ මග සොයා යන සිදුහත් කුමරුට බුදු බව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නැයි ආරාධනා කළ රජතුමා නම්කරන්න.
   iii. බෝසතාණන් වහන්සේට කුසතණ මිටි අටක් පූජා කළ බමුණාගේ නම ලියන්න.
   iv. අධාර්මික අකුසල සහගත ජීවන වෘත්තීන්හි නිරතවීම සම්බන්ධව ධර්මයෙහි හඳුන්වන නම කුමක්ද?
   v. බෝසත් කුමරුට නම් තැබීමට පැමිණි බමුණන් සංඛ්‍යාව කීයද?

(ලකුණු 4 X 5 = 20)

2. i. බුදු ගුණ සිහිකරන පාඨයේ මුල් පේළිය ලියන්න. (ලකුණු 02)
   ii. වන්දනා කිරීම සඳහා අප පන්සලට යන විට රැගෙන යා යුතු දේවල් තුනක් ලියන්න. (ලකුණු 03)
   iii. පන්සලට ගිය පසු අප විසින් කළ යුතු වතාවත් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

3. i. බොරු කීමෙන් වැළකීමේ පන්සිල් පදය ලියන්න. (ලකුණු 02)
   ii. වචනයෙන් සිදුවන අකුසල් තුනක් ලියන්න. (ලකුණු 03)
   iii. යහපත් වචන කතා කිරීමේ අගය කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

4. i. බුදු රජාණන් වහන්සේ සිගාල ගෘහපතියාට දේශනා කළ සූත්‍රය කුමක්ද? (ලකුණු 02)
   ii. සිව් බඹ විහරණ වලින් තුනක් ලියන්න. (ලකුණු 03)
   iii. දෙමාපියන්ට සැළකීමේ අගය දක්වෙන වාක්‍ය 5 ක් ලියන්න. (ලකුණු 05)

5. i. ජාතික කොඩියේ අඩංගු සංකේත දෙකක් ලියන්න. (ලකුණු 02)
   ii. එක් සංකේතයක අර්ථය ලියන්න. (ලකුණු 03)
   iii. ජාතික කොඩිය පරිහරණයේ දී අප සැලකිලිමත් විය යුතු ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

6. i. බුදු රජාණන් වහන්සේ අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය දේශනා කරන ලද්දේ කාහටද? (ලකුණු 02)
   ii. ක්‍රියාවක හොඳ නරක තෝරා ගැනීමට යොදා ගත හැකි මිනුම් දඬු මොනවාද? (ලකුණු 03)
   iii. ඔබ කරන ලද යහපත් ක්‍රියාවන් කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

7. පහත මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි විස්තර ලියන්න.
   i. බුදු හාමුදුරුවෝ   ii. නිරෝගීකම   iii. අපේ පන්සල   iv. වෙසක් පොහෝ දිනය

(ලකුණු 5 X 2 = 10)